ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

# ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

# විශේෂ පුණර් විභාගය - 2023

I කණ්ඩායම (2013), II කණ්ඩායම (2014) සහ III කණ්ඩායම (2015) සඳහා පමණි

## විභාගය අයදුම් කිරීම සඳහා උපදෙස්

- මෙම විභාගය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන විශේෂ පුණර් විභාගයක් ලෙස පැවැත්වේ.
- විභාගය පවත්වනු ලබන්නේ සති අන්තයේ දී හෝ රජයේ නිවාඩු දිනයන් හි ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මිහින්තලේ පරිශ්‍රයේ දී පමණි.
- විභාගය එක් වරක් පමණක් පැවැත්වීමට විශ්වවිද්‍යාලය මඟින් අවසර ලබා දී ඇති බැවින් ඉහත කණ්ඩායම් සඳහා උපාධිය සම්පූර්ණ කිරීමට නැවත විභාගයක් කිසිම ආකාරයකින් නොපැවැත්වේ.
- විභාගය අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබන්නේ ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ I කණ්ඩායම (2013), II කණ්ඩායම (2014) සහ III කණ්ඩායමේ (2015) ලියාපදිංචි වී පළමු සාමාසිකයේ සිට අඛණ්ඩව සාමාසික හයටම අදාල (06) මුදල් ගෙවා වාර්ෂික ලියාපදිංචිය ලබා මේ දක්වා උපාධිය සම්පූර්ණ කිරීමට නොහැකි වු සිසුන් සඳහා පමණි.
- විභාගයට පෙනීසිටීම අනිවාර්ය අතර නොපැමිණෙන සිසුන්හට වෛද්‍ය වාර්තා ලබා දිය නොහැක. විභාගයට පෙනී නොසිටින සියලුම සිසුන් නොපැමිණි සිසුන් ලෙස සලකන අතර ඔවුන්හට නැවත විභාගය සඳහා පෙනී සිටිය නොහැක.
- සියලුම විභාග අයදුම්කරුවන් දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථාන නිල වෙබ් අඩවියේ http://cdce.rjt.ac.lk/cdce/ දක්වා ඇති google form එක 2023 නොවැම්බර් මස 20 වන දිනට පෙර පුරවා එවීම අනිවාර්ය වන අතර විභාග කාලසටහන සහ උපදෙස් පත්‍රිකාව වෙබ් අඩවියෙන් ඉදිරියේ දී භාගත (Download) කරගත හැකිය.
- විභාග ප්‍රවේශපත්‍රය e – mail මගින් ඔබ වෙත එවනු ලබන අතර WhatsApp අංකය සහ විද්‍යුත් ලිපිනය සක්‍රීයව තබා ගත යුතුය.

## මුදල් ගෙවීම

- විභාගය සඳහා රුපියල් 5000.00 ක ලියාපදිංචි ගාස්තුවක් සහ අයදුම්කරණ එක් විෂයක් සඳහා රුපියල් 3000.00 ක මුදලක් ගෙවිය යුතුය.
- පෙර විභාග සඳහා අනුමත වු වෛද්‍ය සහතික මෙම විභාගයට අදාල නොවේ.
- මුදල් ගෙවීම සඳහා ඔබවෙත එවා ඇති වවුචර්පත්‍රය භාවිතා කළයුතු අතර සුදුපාට මුල් පිටපත විභාග අයදුම් පත්‍රය සමඟ අමුණා එවිය යුතුය.
- ඔබ වෙත එවා ඇති සාමාසික විභාග අයදුම් පත්‍රය සම්පූර්ණ කර 2023 නොවැම්බර් මස 20 වන දිනට පෙර පහත ලිපිනයට එවිය යුතු අතර විභාග අයදුම් පත්‍රය යොමු කරන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "2023 BBA විශේෂ පුණර් විභාග අයදුම් පත්‍රය " ලෙස සඳහන් කළ යුතුය.
- විභාග අයදුම්පත් යොමුකළ යුතු ලිපිනය

  නියෝජ්‍ය ලේඛකාධිකාරී, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, බුලංකුලම දිසා මාවත, II වන පියවර, අනුරාධපුර.

## උපාධිය පිරිනැමීමේ නිර්ණායක

- උපාධිය පිරිනැමීම සඳහා පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය.

    - ✓ සෑම අර්ධ වාර්ෂිකයක් සඳහාම අවමය 2.00 GPA අගයක් ලබා ගත යුතු අතර සමස්ථ උපාධි පාඨමාලාවේ අවමය 2.00 GPA අගයක් ලබා ගත යුතුය.

    - ✓ සමස්ථ උපාධි පාඨමාලාව තුළ E ශ්‍රේණියේ සාමාර්ථයක් නොතිබිය යුතුය.

    - ✓ එක් අර්ධ වාර්ෂිකයක D, D+ හෝ C- එකකට වඩා නොතිබිය යුතු අතර සමස්ථ උපාධි පාඨමාලාව තුළ තබාගත හැකි D, D+ හෝ C- සාමාර්ථ ගණන 04 කි.

- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ නීති රීති වලට යටත්ව විභාගය පැවැත්වෙන අතර විශ්වවිද්‍යාලයීය සනාතන සභාවට ඕනෑම මොහොතක විභාග නීති රීති වෙනස් කිරීම හෝ විභාගය අවලංගු කිරීමේ බලය ඇත.

**Special Repeat 2023 RUSL**
WhatsApp group

ඉහත QR කේතය Scan කර WhatsApp සමූහයට එකතු වන්න.

සහකාර ලේඛකාධිකාරී/ විභාග
ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

විමසීම් - 025 2260220     වෙබ් අඩවිය www.rjt.ac.lk/cdce     e-mail exam@cdce.rjt.ac.lk